052913
2015/07/21
ML/PR
D-820

# දේශීය අංගරචනා කලාවේ ප්‍රභවය හා විකාශනය.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාත්
උපාධි අධ්‍යයන කේන්ද්‍රයේ ශාස්ත්‍රපති
පර්යේෂණ උපාධි අවශ්‍යතාව සමග
ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනය.

අංකය :- DD/MA/DA/09/046

වර්ෂය :- 2009/2010

# හැඳින්වීම.

නර්තනය හා නාට්‍ය කලාව ප්‍රාසංගික කලාවේ දී ඉතා විශේෂ වූ මාධ්‍යයන් දෙකක් ලෙස හැඳින්විය හැකි ය. එහි ප්‍රාසංගිකත්වය තව තවත් ඔප මට්ටම් කිරීමෙහි ලා අංගරචනය මනා පිටුවහලක් ලබා දෙයි. දේශීය නර්තන කලාවේ දී භාව ප්‍රකාශනය සඳහා අංගරචනය ලබා දෙන්නා වූ දායකත්වය අගය කළ හැකි වේ. අතීතයේ දී අංගරචනය භාවිත කිරීම සුළු වශයෙන් සිදු කළ ද අද්‍යතනයේ දී නර්තනය පෝෂණය කරන තවත් එක් අංගයක් බවට එය පත් වී හමාර ය. එමගින් ප්‍රේක්ෂක ගත, සිත පමණක් නොව නෙත් ඇඳ බැඳ තබා ගන්නා අයුරින් අංගරචනය භාවිත කරනු ලබයි.

**"දේශීය අංගරචනා කලාවේ ප්‍රභවය හා විකාශනය"** යන මාගේ පර්යේෂණ මාතෘකාව ඔස්සේ සතර අභිනයේ එන ආහාර්ය අභිනයට අයත් එක් ආනුෂංගික අංගයක් වන **"අංගරචනය"** නර්තන කලාවේ භාව ප්‍රකාශනයට ප්‍රබල ලෙස බලපෑමක් සිදු කරන බව නිරීක්ෂණය කර බලා සාකච්ඡා කිරීමට මා උත්සාහ දැරීමි.

ඒ අනුව මේ නිබන්ධනය මාතෘකා හා අනු මාතෘකා ඇතුළත් පරිච්ඡේද පහකින් සමන්විත ය.

මෙහි පළමු පරිච්ඡේදය මගින් අංගරචනා කලාව හැඳින්වීම යටතේ අංගරචනය යනු කුමක් ද යන්න හඳුන්වා එහි වාච්‍යාර්ථය පිළිබඳ ව නිර්වචනයන් ඔස්සේ සාකච්ඡා කර අංගරචනා කලාවේ ප්‍රභේදයන් හා අංගරචනා කලාවේ පවතින අවශ්‍යතාව පිළිබඳව ද විස්තර කර ඇත. එමෙන් ම අංගරචනා කලාවේ දී භාවිත වර්ණයන් හා අංගරචනා ශිල්පියා සතු කාර්ය භාරය පිළිබඳවද මෙහි දී සාකච්ඡාවට ලක් වී ඇත.

දෙවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කිරීමට උත්සාහ දරා ඇත්තේ අංගරචනා කලාවේ ප්‍රභවය හා විකාශනය සඳහා තුඩු දුන් ඓතිහාසික පසුබිම හා ප්‍රභවය පිළිබඳව ය. එසේ ප්‍රභවය ලද අංගරචනා කලාවට මූලාරම්භය ලබා ගත්තේ ගෝත්‍රික ජනතාව යි. එසේ ප්‍රාථමික ජනසමාජයන් හි භාවිත අංගරචනා කලාව පමණක් නොව පෙර අපර දෙදිගම භාවිත කරන්නා වූ අංගරචනා කලාවන් පිළිබඳ ව මෙහි දී වැඩි දුරටත් සාකච්ඡාවට ලක් කර ඇත.

තෙවන පරිච්ඡේදය වෙන් වී ඇත්තේ දේශීය අංගරචනා කලාවේ ප්‍රභවය හා විකාශනය සඳහා ය. එහි දී දේශීය ශාන්තිකර්ම (උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදා) ආශ්‍රිත නර්තනාංග වලදී අංගරචනය භාවිත කරන අයුරුත්, ජන නාටක ආශ්‍රිත අංගරචනය පිළිබඳ වත්, නර්තන කලාව ආශ්‍රිත අංගරචනය පිළිබඳවත් සාකච්ඡා කරමින් එය භාව ප්‍රකාශනය සඳහා ලබා දෙන්නා වූ දායකත්වයෙ හි අගය විස්තර කර ඇත.

සිව්වන පරිච්ඡේදය වෙන් ව ඇත්තේ දේශීය වේදිකා නාට්‍යයන් හි භාවිත අංගරචනා කලාව පිළිබඳව සාකච්ඡා කිරීමට යි. එහි දී නූතන රංග කලාව උදෙසා භාවිත කරන්නා වූ අංගරචනය නොයෙක් අනු මාතෘකා ඔස්සේ විස්තර කර ඇත. ඊට අමතර ව අංගරචනා කලාවේ භාවිත කරනු ලබන අංගරචනා අමුද්‍රව්‍යයන් පිළිබඳ ව හා දේශීය අංගරචනා කලාව සඳහා අතීතයේ සිට අද දක්වා දායකත්වය ලබා දුන් හා දායකත්වය ලබා දෙන ශිල්පීන් පිළිබඳව ද මේ පරිච්ඡේදයේ දී විග්‍රහ කර ඇත.

අවසාන පරිච්ඡේදය වන පස්වන පරිච්ඡේදය දේශීය අංගරචනා කලාවේ අද්‍යතන ස්වරූපය පිළබඳ ව සාකච්ඡා කිරීම සඳහා වෙන් වී ඇත. එහි දී අංගරචනා කලාවේ ප්‍රවර්ධනය උදෙසා ඉදිරිපත් කරන නව යෝජනාවන් සාකච්ඡා කර ඇති අතර මේ පර්යේෂණ නිබන්ධිකාවේ මූලිකව ම සාකච්ඡාවට භාජනය කරන ලද දේශීය අංගරචනා කලාව ප්‍රේක්ෂක රසඥතාව අරමුණු කර ගත් නර්තන කලාවේ ආකර්ශනීය ගුණය මතු කිරීමට ප්‍රබල බලපෑමක් සිදු කරන බවත්, එයින් භාව ප්‍රකාශනයට මනා පිටුවහලක් ලබා දීම පිළිබඳවත් සාකච්ඡා කිරීමට උත්සුක වී ඇත.